# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### කොන්ත්‍රාත් අංක - SRS/F.7814

කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ ස්ථිර ආපනශාලා ඒකක හා දුරගමන් සේවා දුම්රියවල ජංගම ආපනශාලා ඒකක වසර 02 ක කාලයක් සඳහා කුලියට ලබා දීම.

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ආපනශාලා සේවා සැපයීමේ අවම වසර පහක සාර්ථක පලපුරුද්ද සහිත අයවලුන් වෙතින්, කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ ආපනශාලා ඒකක හා දුරගමන් සේවා දුම්රියවල ආහාරපාන අලෙවි කිරීමේ සේවා ලබා දීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

මෙම ස්ථිර හා ජංගම ආපනශාලා ඒකක දෙකම සඳහා ඇගැයුම් කිරීම හා කොන්ත්‍රාත් භාරදීම එක් ඒකකයක් ලෙසට සිදුකරනු ලැබේ.

**මුළුතැන්ගෙය හා බේකරිය සහිත ස්ථිර ආපනශාලා ඒකක**

- කොළඹ කොටුව (අංක 03 වේදිකාව) 1 වන හා 2 වන පංති ආපනශාලාව
- කොළඹ කොටුව (අංක 03 වේදිකාව) 3 වන පංතිය ආපනශාලාව.
- කඩල අලෙවිකුටි (අංක 03 වේදිකාව) දෙකක්.
- කුඩා අලෙවි කුටි (2 වන හා 3 වන වේදිකා)
- කුඩා අලෙවි කුටි (5 වන හා 6 වන වේදිකා)
- දුම්රියපල පිටුපස කුඩා අලෙවිකුටිය (පිටවීමේ දෙරටුව අසල - ව.අඩි 100)
- මුළුතැන්ගෙය හා බේකරිය.

**ජංගම ආපනශාලා ඒකක**

**දුරගමන් සේවා දුම්රිය ගමන් වාර (ඉහළට හා පහළට)**

- 1045 / 1046 බදුල්ල රාත්‍රී තැපැල් දුම්රිය
- 1005 / 1006 පොඩි මැණිකේ.
- 1015 / 1016 උඩරට මැණිකේ
- 6079 / 6080 මිහගයා, නගරාන්තර සීඝ්‍රගාමී දුම්රිය
- 1023 / 1024 ටිකිරි මැණිකේ.
- 4077 / 4078 යාල් දේවි
- 4089 / 4090 යාපනය රාත්‍රී තැපැල් දුම්රිය
- 4021 / 4022 යාපනය නගරාන්තර සීඝ්‍රගාමී දුම්රිය (A/C)
- 1019 / 1020 මහනුවර සීඝ්‍රගාමී දුම්රිය.
- 1029 / 1030 මහනුවර නගරාන්තර සීඝ්‍රගාමී දුම්රිය (A/C)
- 1033 / 1034 මහනුවර සීඝ්‍රගාමී දුම්රිය.

ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු රුපියල් 10,000.00 (දස දහසක්) ගෙවීමෙන් 2023-12-19 දින ප.ව. 3.00 දක්වා කාලය තුළ, කොළඹ 10, ඕල්කොට් මාවත, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයෙන් ලබාගත හැකි ලංසු ලේඛන මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුවේ.

ලංසු භාර ගැනීම, 2023-12-20 දින ප.ව. 2.00 ට අවසන් කරනු ලබන අතර, ඒ හා සමගම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයේදී ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

ලංසු, ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලය ඕල්කොට් මාවත, කොළඹ 10 යන ලිපිනයට එවීමෙන් හෝ කොළඹ 10, ඕල්කොට් මාවතේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) තිල කාමරයේ මේ සඳහා තබා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් අදාළ අවසන් දිනයට හා වේලාවට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**මේ සම්බන්ධ පෙර ලංසු හමුවක්, කොළඹ 10, ඕල්කොට් මාවතේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයේදී 2023-12-13 දින පෙ.ව. 10.00 ට පැවැත්වීමට නියමිතය.**

ලංසු භාරදීමට පෙර, අදාළ ආපනශාලා, ලංසුකරුවන්හට පරීක්ෂා කොට බැලිය හැක. මේ සම්බන්ධයෙන්, පහතින් සඳහන් කොට ඇති දුරකථන අංක මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) අමතන්න.

දුරකථනය - 011-4600944

සියලුම ලංසු ලේඛන සමග, ආපසු ගෙවනු ලබන රුපියල් 2,500,000.00 (රුපියල් දෙමිලියන පන්ලක්ෂයක්) වටිනා ලංසු බැඳුම්කරයක් ලෙසට ගෙවා ලබාගත් ලදුපත ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු බැඳුම්කරය, ශ්‍රී ලංකාවේ වලංගු හා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරීහට පිළිගත හැකි මුදල් වර්ගයකින් ගෙවීමෙන් හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අනුමත කළ බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයක් ලෙසට ගෙවිය හැක. එසේ තැම්පත් කරනු ලබන ලංසු බැඳුම්කරය, මාස 06 ක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, කොන්දේසි විරහිත එකක් විය යුතුය.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සේවකයන් හෝ ඔවුන්ගේ සමීපතම ඥාතීන්හට මෙම ටෙන්ඩරයට සහභාගී වීමට අවසර නොමැත.

මේ සම්බන්ධ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

අවශ්‍ය වැඩිදුර තොරතුරු, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, (ප්‍රසම්පාදන) හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) වෙතින් ලබාගත හැක.

ඇමතුම් අංක : 011-2438078 / 011-2436818 / 011-4600944

ෆැක්ස් : 0112432044

**සභාපති,**

**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**

**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**